# ථෙරවාදී භාණක සම්ප්‍රදාය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

මඩිගේ සුගතසිරි හිමි

## හැඳින්වීම

මේ ලිපියෙහි අරමුණ වන්නේ භාණකයන් යනු කවුරු ද ධර්මය පරම්පරාගත ව පවත්වාගෙන ඒමෙහි ඔවුන්ගේ කාර්යභාරය හා වගකීම කුමක් වී ද යන කරුණු විමසා බැලීම යි. සම්බුද්ධත්ව ප්‍රතිලාභයත් සමග ම බුදුහිමියන් ධර්මය දේශනා කිරීමට යම් මන්දෝත්සාහී ස්වභාවයක් දැක්වූ බව මහාවග්ගපාලියෙහි සඳහන් ය. එහි දී බුදුරදුන්ට ඇති වූ පරිවිතර්කය වූයේ මා විසින් අවබෝධ කරගත් ධර්මය ගැඹුරු ය. දැකීමට අපහසු ය. අවබෝධයට පහසු නොවේ. ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් දත නොහැකි ය. සියුම් ය, නුවණැත්තන් විසින් දත යුතු ය. මේ ප්‍රජාව පඤ්චකාම ගුණයෙන් සතුටු වන්නේය, පඤ්චකාම ගුණයන්හි දැඩි ඇලුණු සිත් ඇත්තෝ ය, එබඳු මිනිස් සමූහයකට මේ ප්‍රතීත්‍යසමුත්පාදයෙන් යුක්ත වූ මේ ධර්මය දැකීමට දුෂ්කර ය. සියලු උපධීන් ප්‍රතිනිස්සර්ජනය කරන්නා වූ නිර්වාණය අවබෝධ කරගැනීම අපහසු බව පරිවිතර්කයක් ඇති විය, එසේ මන්දෝත්සාහී වූ බව තේරුම් ගත් සහම්පති මහාබ්‍රහ්මයා බුදුරදුන් වෙත පැමිණ ධර්මය දේශනා කරන ලෙස ඉල්ලා සිට ඇත. බ්‍රහ්මාරාධනාවෙන් පසුව ලෝකය දෙස බලන්නේ අල්ප රජස්ක වූ ධර්මාවබෝධයට සුදුසු පුද්ගලයන් සිටින බව පියුම් පොකුණක මල්වල විවිධ අවස්ථාවන් සේ උන්වහන්සේ දුටු බව මහාවග්ගපාලියෙහි සඳහන් වේ. ඒ අනුව කතපුණ්‍ය, චරිමභවික ස්වභාවයෙන් සිටින ධර්මාවබෝධය ඇති කරගත හැකි එබඳු පුද්ගලයන් උදෙසා ධර්මය දේශනා කිරීමට උත්සුක වූ බවත් මහාවග්ගපාලියෙහි සඳහන් ය. [2]